

# 2025 අය-වැය
## ජනතා අදහස්

'පොහොසත් රටකට ලස්සන ජීවිතයකට පළමු පියවර' 2025 නව රජයේ මංගල අය - වැය යෝජනාවලිය පෙරේදා (17) ජනපති අනුර කුමාර දිසානායක මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය. එහිදී විවිධ අංශ යටතේ සහන මල්ලක් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට යෝජනා වූ අතර එහිදී ඉදිරිපත් වූ යෝජනා සම්බන්ධයෙන් ජනතාව 'දිනමිණට' මෙසේ සිය අදහස් දැක්වූහ.

**දිල්හානි ජයවර්ධන, නිසංසලා කොට්ටගස්වත්ත, ඉන්දීවරී පෙරේරා, තරුෂි අධිකාරි, දුලක්ෂි උඩගෙදර, මිලිඳු තෙන්නකෝන්,** ***ඡායාරූප - රංජිත් අසංක***

## ධීවර කටයුතුවලට මුදල් වෙන් කිරීම හොඳයි

**නිරෝෂ ලංකාතිලක** - මැල්සිරිපුර



"ධීවර කටයුතුවලට මුදල් වෙන් කිරීම රජය ගත්තු හොඳ තීරණයක්. මිරිදිය ධීවර සම්පත එහෙම අද වෙනකොට විනාශ වෙලා තියෙනවා. ඒ, අපේ නීතිරීතිවල තියෙන අඩු ලුහුඬුකම් නිසයි.

මිරිදිය ධීවර කර්මාන්තයේදී මත්ස්‍ය සම්පත නෙළාගන්න භාවිත කරන දැල් තියෙනවා. අඟල් හතරට උඩ. මේ දැල් පාවිච්චි කිරීම හරියටම කරන්න ඕනෑ. වෘත්තීය ධීවරයෝ නම් මේ වැඩේ හරියට කරනවා. නමුත් ගම්වල ඇතැම් අය පොඩි දැල් අරන් මාළු අල්ලනවා. මේ වැඩෙන් වෙන්නේ කිලෝ එකට, එකහමාරට ලොකු වෙන්න තියෙන මාළු නැති වෙන එකයි. මේ ගැටලු ගැනත් අවධානය යොමු කරනවනම් ගොඩක් හොඳයි "

## ක්‍රියාත්මක වුණොත් හොඳයි

**එස්. නාරායන්** - කඩුගන්නාව



මෙතෙක් කල් පොරොන්දු දුන්නා ඒවා ඉෂ්ට කරලා නෑ. කට වචනයට මැතිවරණ වේදිකාවල කිවුවට අය - වැයකින් මේ වගෙ ඉදිරිපත් කළ පළමුවැනි වතාව මෙය කියලා මට කියන්න පුළුවන්.

මගේ වයසත් එක්ක මම ගොඩක්, අය - වැය අහලා දැකලා තියෙනවා. නමුත් මෙවර අය - වැය ගොඩක් සාර්ථකයි. අපි දන්නෙ නෑ මේවා ක්‍රියාත්මක වෙයිද නැද්ද කියලා නම්. නමුත් අය - වැය සම්මත කරගන්න එකත් ආණ්ඩුවට අපහසු නෑ. තුනෙන් දෙකකට වඩා වැඩි බලයක් තියන නිසා ඒක කරගන්නත් පහසුයි. මම මේ අය - වැයෙන් බලාපොරොත්තුවෙන්නෙ ස්වයං රැකියා කරන කෙනෙක් වශයෙන් ස්ථිර ආදායම් මාර්ගයක්.

ණය ක්‍රියා මාර්ගයකට වඩා ආධාරයක් තමයි බලාපොරොත්තු වෙන්නෙ. ණය දුන්නට ලොකු මුදලක් ආපසු අය කරගන්නවා. ණයවලින් කොටසක් ජීවන වියදමට ගියාම අපට ව්‍යාපාරයක් දියුණු කර ගන්න අවස්ථාවක් නෑ.

## ජනතාවගෙ පැත්තෙන් හිතලා



**එස්.එම්. ඉසදීන්** - මාතලේ

මම හිතනවා බොහොම හොඳ අය - වැයක් වෙයි කියලා. ගොඩක් මහජනතාවගෙ පැත්තෙන් හිතලා ගෙන ආව අය - වැයක් කියලා කියන්න පුළුවන්. මෙවර අය - වැය සාධාරණයි කියලා හිතනවා. පසුගිය කාලයේ බස් රථවලට ප්‍රශ්න ගොඩක් ආවා. මම හිතන්නෙ බස් රථවලත් වැරදි අඩුපාඩු තියෙනවා. වෙනස් වෙන්න ඕනෙ දේවල් ගොඩක් මේ ආණ්ඩුවෙන් වෙනස් කළා. මෙච්චර කාලයක් වුණු දේවල් එක්ක ලොකු දෙයක් බලාපොරොත්තුවෙන්න බෑ . නමුත් මම හිතනවා මෙවර අය - වැයෙහි ලොකු සාධාරණ පැත්තක් තියෙනවා කියලා.

## රනිල්ගේ අය-වැයක්

**ඒ. එම්. රණතුංග** - වාරියපොළ



මේ ආණ්ඩුව ගෙනල්ල තියෙන්නෙ රනිල් වික්‍රමසිංහගේ අය වැයක්. සහනාධාර දෙන ප්‍රතිපත්තියක් මේ ආණ්ඩුවට නැහැ. මේ ආණ්ඩුවට කොහොමත් රට කරන්න බැහැ. අනිවාර්යයෙන්ම මේ අය වැය ඉදිරි ඡන්ද ඉලක්ක කරගෙන දාලා තියෙන අය වැයක් කියලා කියන්න පුළුවන්. මට කියන්න තියෙන්නේ ඉතින් මේක රනිල් වික්‍රමසිංහගේ අය වැයක් කියන එක තමයි.

## කඩවලට ගිහින් ප්‍රශ්න කරන්න



**අනුරුද්ධ නිශාන්ත** - පොලොන්නරුව

මොන රජයෙන් මොන දේ අඩුකරත් මේ රටේ ඉන්න වෙළෙන්දෝ ඔක්කොම හොරු. ඒ ගැන හොයන්න කිසිම කෙනෙක් නෑ. හොරෙන් බිල අඩු වුණාත් ඒකෙ වාසිය අපිට ලැබිලා නෑ. මාධ්‍යවලින් කරන්න ඕනේ අපෙන් ඇවිල්ල මේ දේවල් අහන එක නෙවෙයි. කඩවලට ගිහින් ප්‍රශ්න කරන්න ඇයි මේ විදුලි බිල අඩු කරත් බඩු මිල අඩු කරන්න බැරි ඇයි කියලා.

## හොඳ තීරණ ගොඩක් තියෙනවා

මැණික් ව්‍යාපාරික - **පාලිත සරත් පොල්වත්ත**



අය වැය ගැන මම සම්පූර්ණ කතාවම ඇහුවේ නෑ. නමුත් මම තැනින් තැනින් ඇහුවා. ඒ සම්බන්ධ ඇත්තටම කියන්න තියෙන්නෙ මේ පාර අය වැය හොඳයි. ඒ වගේම මැණික් ව්‍යාපාරය එක්ක කතා කළොත් මැණික් ව්‍යාපාරයේ වංචා දූෂණ අල්ලස් ගන්නත් එපා. අල්ලස් දෙන්නත් එපා කීවා. ඒ ගැන බොහොම කැමැත්තක් දක්වනවා. මොකද මැණික් සම්බන්ධ ආයතනවල බොහොමයක් මේ කියන අල්ලස සිදු වෙනවා. අල්ලස, දූෂණය නැති තැන රටක් දියුණු කරන්න පුළුවන්. ඒ වගේම රජයේ සේවකයන්ට පඩි වැඩි කරපු එකත් හොඳ තීරණයක්. අධ්‍යාපනයට හා සෞඛ්‍යයට විශාල මුදලක් වෙන් කරලා තියෙනවා. ඒක බොහොම හොඳ ප්‍රගතියක්. මොකද දුප්පත් මිනිස්සුන්ටත් තියෙන එකම සහනය තමයි, තමන්ට බෙහෙත් ටිකක් ගන්න එක, දරුවන්ට අධ්‍යාපනය කරන එක, දුප්පත් මිනිස්සු බොහොම අමාරුවෙන් තමයි මේ ජීවිතය ගත කරන්නේ. එතකොට සමස්ත අය වැය එක්ක දුප්පත් මනුස්සයාට ගෙනැල්ලා තියෙන මේ සහන බොහොම හොඳයි, ඒ වගේම අය වැයේ තියෙන හොඳ ප්‍රගතිය මැණික් කර්මාන්තයටත් විශාල ලෙස බලපෑම් කරනවා.

## සහන ටිකක් මදි

**මංගලා ප්‍රියදර්ශනී ජයතිලක** - කටුපොත



අපි වගේ අයට ලැබෙන සහන මොනවද කියලා තමා අහගෙන හිටියෙ. මට තේරෙන විදිහට ඉගෙන ගන්න දරුවෝ ගැන නම් ගොඩක් හිතලා තියෙනවා. රජයේ රස්සා කරන අයට නම් පඩි වැඩි කරලා තියෙනවා. හැබැයි ඒ අය ළඟට වැඩක් කර ගන්න ගියාම වෙන රස්තියාදුව ගැන නම් කියලා වැඩක් නෑ. වැඩි වෙච්ච පඩිය අතට ගත්තාට වැඩක් නෑ. ඒ වෙනුවෙන් හරියට සේවය කරන්නත් ඕනෙ. හොඳට වැඩ කරන නිලධාරීන් ඉන්නවා. ඒ අතරෙ ටික දෙනෙක් තමා මේ වගේ පඩිය අතට අරන් නිකන් ඉන්නෙ. ස්වයං රැකියා කරන අපිට නම් ලැබිලා තියෙන සහන ටිකක් මදි. මොනවා වෙලා හරි බඩු මිල ටිකක් අඩුවෙලා ජීවිතය ගෙන යන්න පුළුවන් වටපිටාවක් හැදෙනවා නම් හොඳයි.

## හොඳ අය-වැයක්



**සුනීතා** - කඩවත

ඇත්තටම හොඳ අය වැයක් මේක. රට ගොඩනඟාගෙන ඉදිරියට යන්න පුළුවන් අය - වැයක් ඉදිරිපත් කරලා තියෙනවා. දුන් පොරොන්දු ඒ විදිහටම ඉෂ්ට කරන බවට ලොකු විශ්වාසයක් මට තියෙනවා. ඒ වගේම අලුත් ආණ්ඩුව ඉස්සරහටම යනවා බය වෙන්න දෙයක් නෑ.

## වෙනසකට ඇරඹුමක්

**මුදිත** - මීරිගම



මම තොරතුරු තාක්ෂණික නිලධාරියෙක්. මම හිතන්නේ මේක ලොකු වෙනසක් කරන්න පටන් ගැනීමක් කියලා. රටේ තියෙන තත්ත්වෙත් එක්ක ලොකු දෙයක් කරන්න බැරි වුණත් හොඳ ආරම්භයක් අරගෙන තියෙනවා. නව ආණ්ඩුව අධ්‍යාපනයට අය වැයෙන් ලොකු මුදලක් වෙන්කරලා තියෙනවා. අධ්‍යාපනය පැත්ත දියුණු කරනවා කියන්නේ කොහොමත් රටක දියුණුවට හේතුවක් වෙනවා. මේ රටට ලොකු දියුණුවක් වෙයි කියලා හිතෙනවා. අලුත් ආණ්ඩුව හොඳ ආරම්භයත් අරගෙන තියෙනවා කියල කියන්න පුළුවන්.

## මුදල් අසරණ මිනිසුන් වෙනුවෙන්ම යොදවන්න

**යූ. උක්කුබණ්ඩා** - රත්තොට



මම රාජ්‍ය සේවයේ ඉඳලා විශ්‍රාම ගිය කෙනෙක්. බලයට පත් වූ සෑම රජයක්ම අය - වැය ඉදිරිපත් කරද්දී අපි බැලුවේ ලැබෙන සහන මොනවාද කියලා. මේ සැරෙත් ඒ වගේම බලාගෙන හිටියා. යම් යම් ක්ෂේත්‍රවලට සතුටු විය හැකි ආකාරයේ සහන ලැබී තියෙනවා. විශේෂයෙන් අධ්‍යාපනයට වගේම සෞඛ්‍යයට විශාල මුදලක් වෙන් කර තියෙනවා. ඒ ගැන සතුටුයි.

අධ්‍යාපනයට විශාල මුදලක් වෙන් කළා කියන්නේම දරුවන්ගේ අනාගතය වෙනුවෙන් කර තිබෙන හොඳම ආයෝජනයක්. අපේ වගේ රටක සෞඛ්‍ය ක්ෂේත්‍රයට සැලකිය යුතු ප්‍රමාණයකින් මුදල් වෙන් කිරීම අපි වගේ සාමාන්‍ය මිනිසුන්ට හරිම වටිනවා. හේතුව අසනීපයකට බෙහෙත් ටික ගන්න ඉස්පිරිතාලෙට ගියාම ලෙඩේ බලලා තුන්ඩුවක් අතට දෙනවා නම් වුවමනා බෙහෙත් ටික ෆාමසියෙන් ගන්න කියලා ඒක අපට ලොකු පීඩාවක්. මේ තත්ත්වය නැති කරන්න පුළුවන් නම් ඉතාම වටිනවා.

ඉස්පිරිතාලෙ හරියට බෙහෙත් ටික තියනවා නම්, දොස්තරලා හරියට ඉන්නවා නම් පෞද්ගලික ඉස්පිරිතාලවලට නිස්කාරණේ සල්ලි වියදම් කරන්න ඕනෙ නෑ. ඒ හින්දා සෞඛ්‍යයට වෙන් කළ මුදල් අසරණ මිනිසුන් වෙනුවෙන්ම යොදවන්න.

## බඩු මිල අඩු කරන දෙයක් කියවුණේ නැහැ

**දිලිනි උදයංගනී** - වත්තියාව



අය - වැය යෝජනා ඉදිරිපත් කරන කොට හැමෝම බලන්නේ සහනයක් ලැබෙනවාද කියලා. අපි රස්සා කරන අය නෙවෙයි. හැබැයි අපි ගෘහිණියන් විදිහට කරන්නේ එසේ මෙසේ සේවයක් නෙවෙයි. මහත්තයාගේ මාසේ පඩිය බැලන්ස් කරලා පවුල නඩත්තු කරනවා වගේම, දරුවන්ගේ පාසල් අධ්‍යාපන කටයුතු ටිකත් කරගන්න ඕනේ. ගෘහිණියන් වෙනුවෙන් කිසිම සාධාරණයක් මේ පාර අය වැයෙන් වෙලා නැහැ කියලයි මට හිතෙන්නේ. බඩු මිල අඩු කරන්න කරපු දෙයක් කියවුණේ නැහැ.

## කියන දේවල් කරනකම් ඉන්නේ

**තිමති ෆර්නෑන්ඩො** - නැදගමුව



මෙවර අය - වැයෙන් අස්වැසුම දීමනාව වැඩි කළා කියලා දැනගන්න ලැබුණා. මටත් අස්වැසුම හම්බ වෙනවා. නමුත් මේ අස්වැසුම යමක් කමක් තියෙන පිරිසකට හම්බවෙනවා කියලයි මට නම් පෙනෙන්නෙ. මම හෘද රෝගියෙක්. මට නම් මේ අස්වැසුම ගොඩක් ප්‍රයෝජනවත් වෙනවා. බඩු මිල අඩු කළාම ඒක කඩවලින් අඩු කරන්නෙ නෑ කියලා මිනිස්සු බණිනවා. මම කියන්නෙ මුලින්ම ලොකු ලොකු කඩවල්, වී මෝල් හිමියන්ට පියවරක් ගන්න ඕනෑ. මිල වැඩි කරපු ගමන් වැඩි කළාට මිල අඩු කරපු ගමන් බඩු ටික හංගල ගණන් වැඩි කරනවා. ආණ්ඩුවට දොස් කියන්න බෑ. තවම මාස දෙක තුනක් වෙන්නෙ. කියන දෙවල් අය - වැයෙන් කරයිද කියලා අපි බලාගෙනයි ඉන්නෙ.

## සහන බෙදිලා ගිහින්

**ආර්. එම්. ශාන්ත** - දෙහිඅත්තකණ්ඩිය



මම විශ්‍රාමික විදුහල්පතිවරයෙක්. කලින් තිබ්බට වඩා විමධ්‍යගතව බෙදිලා ගිහින් තියෙනවා. ගොවියන්ට දීලා තියෙන පොහොර සහනාධාරය නැවතත් ඒ විදිහට දීලා තියෙනවා.

මට නම් තේරෙන විදිහට සාමාන්‍ය ජනතාව කෙරෙහි වැඩිපුර හිතලා තියෙනවා. සමහර අය කියන විදිහටම සියයට ගණන් අඩු කරන්න බැරිව ඇති රජයට. නමුත් අවස්ථා 03ක් ඔස්සේ වැටුප් වැඩි කරන්න කටයුතු කරලා තියෙනවා. මට තේරෙන විදිහට නම් යම් කිසි සහනයක් සලස්වා තියෙනවා.

## කිවුවෙ එකක් කරන්නේ එකක්



**එන්. සූරියකාන්ති** - රාගම

වියදම් වැඩිවීමත් එක්ක බලපුවාම එතරම් සහනයක් ලැබී තිබෙන බව හිතන්න බැහැ. අද භාණ්ඩ මිල ඉතා ඉහළයි. රාජ්‍ය සේවකයන්ට 5250 යි මේ අවුරුද්දට වැඩි වන්නේ. ලබන අප්‍රේල්වලට 5000යි වශයෙන් අවුරුදු 3 කට තමයි වැටුප් වැඩිවෙන්නේ. ඒ කාලේ වෙන විට තවත් අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යයි. ජනතාවාදී අය වැයක් කිවුවට මේක එහෙම හිතන්න බැහැ. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ කාලේ වැඩි කරපු 5000 තමයි මේ වැඩි වෙන්නේ. මැතිවරණ වේදිකාවේ කිවුවෙ එක දෙයක්. කරන්නේ එක දෙයක්. සමස්තයක් ලෙස ගත් කල මේකත් සාමාන්‍ය අය වැයක් පමණයි. ජනතාවට දැනෙන විශාල සහනයක් මේකෙ නැහැ.

## ස්වයං රැකියා කරන අපිට දැනෙන්නේ නෑ

**චාලක** - ඉඹුල්ගොඩ



අධ්‍යාපනයට මෙච්චර ගාණක් වෙන් කළා කියලා කියනවා. ඒ වුණාට මොනවට්ද මේ වෙන් කළේ කියලා අපි වගේ අයට තේරුමක් නෑ.

රජයේ රැකියා කරන අයට පඩි වැඩි කරනවා කිවුවට අපි වගේ ස්වයං රැකියා කරන අයට දැනෙන්නේ නෑ. අපිට දෙයක් කරලා තියෙනවා නම්, අපිට දැනෙනවා. සමස්ත ලෙස මේ හැම දෙයක්ම කරන්න පුළුවන් නම් රජය සාර්ථකයි.

---

# ජනතා මන්ත්‍රණය

## කොත්මලේ මල්දෙණියට නළ ජලය නෑ

කොත්මලේ ආසනයේ කොත්මලේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ සෑම ප්‍රදේශයකටම වාගේ නළ ජල පහසුකම් ලබාදී ඇත. එහෙත් කොත්මලේ, මෑතගම, මල්දෙණිය ප්‍රදේශයට මේ දක්වා නළ ජලය පහසුකම් ලබා දී නොමැත.

මේ නිසා මෑතගම, මල්දෙණිය ප්‍රදේශවාසීන්ට බීමට ජලය ලබා ගැනීමේදී ඉමහත් දුෂ්කරතාවන්ට මුහුණපෑමට සිදුවී ඇත. එහෙත් මේ දක්වා වගකිවයුතු බලධාරීන්ගේ අවධානය ඊට යොමු වී නොමැත. එම නිසා දැන්වත් අදාළ වගකිවයුතු බලධාරීන්ගේ අවධානයට යොමු වී කඩිනමින් මෑතගම, මල්දෙණිය ප්‍රදේශයට නළ ජල පහසුකම් ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

**වසන්ත ද සිල්වා - වැලිගම**

## සමාජයේ බැඳීම හා අධ්‍යාපනයේ කාර්යභාරය

දැනුම ලබා ගැනීමට හා සංස්කෘතිය තම වර්ගයාට පවරාදීමට අදාළ ක්‍රියාවලිය අධ්‍යාපනය ලෙස මුල් අවධියේ බොහෝ දෙනා අර්ථ දැක්වුවද පසුකාලීනව එය දැනුම ලබාගැනීමෙන් ඔබ්බට ගොස් ජීවත්වීමේ පරමාර්ථය දක්වා වෙනස් වී ඇත. පුද්ගලයා තුළ දැනුම, කුසලතා, ආකල්ප මෙන්ම වටිනාකම්වල සංවර්ධනයක් ඇති කිරීම වර්තමාන අධ්‍යාපනය තුළින් බලාපොරොත්තු වෙයි.

අධ්‍යාපනය යනු ජීවිතයට සූදානම් වීම නොව ජීවත්වීම බව අධ්‍යාපනය පිළිබඳ දාර්ශනිකයකු වූ ජෝන් ඩිවී ප්‍රකාශ කර ඇත.

වර්තමානය වනවිට ගෝලීයකරණය මෙන්ම තවත් බොහෝ කරුණු හේතුවෙන් සමාජය ආවෘත තත්ත්වයෙන් මිදී විවෘත සමාජයක් දක්වා වෙනස් වී ඇති අතර එවැනි තත්ත්වයක් තුළ අනාගත සමාජයට අවශ්‍ය වන පුද්ගලයා නිර්මාණය කිරීමේදී සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම අධ්‍යාපනය මත පැටවී ඇති බාරදූර කාර්යයකි.

විවිධ පසුබිම්වල පුද්ගලයන් සංස්කෘතික, වාර්ගික, සමාජ, ආර්ථික වශයෙන් ඒකාබද්ධ සමාජ රාමුවකට ගෙනඒමේ ක්‍රියාවලිය සමාජ ඒකාබද්ධතාව ලෙස දැක්විය හැකි අතර මෙම කාර්යයේ දී අධ්‍යාපනය හේතු කිහිපයක් මත ප්‍රබලතම මාධ්‍යයක් බවට පත්වී ඇත.

එකිනෙකා කෙරෙහි දක්වන ගෞරවය, විවිධ තත්ත්වයන්වලදී දක්වන ඉවසීම, සන්නිවේදනය වැනි මූලික වටිනාකම් ඉගැන්වීම තුළින් විවිධාකාර සමාජයක ඵලදායී ලෙස ජීවත්වීමට සිසුන් යොමු කිරීම හා එකිනෙකා අතර පවතින වෙනස්කම් අගය කරන පරිසරයක් පෝෂණය කිරීම අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් සිදුවිය යුත්තකි.

එපමණක් නොව දියුණු වූ පාසල් සංස්කෘතියක් තුළ ලබා දෙන අධ්‍යාපනය සිසුන්ගේ විවේචනාත්මක චින්තනය වර්ධනය කරන අතර සංකීර්ණ සමාජ ප්‍රශ්න විසඳා ගැනීමට සිසුන් දිරිමත් කරමින් සමාජ ඒකාබද්ධතාවට බාධා කරන චින්තනයන්ට හා අගතිගාමීබවට අභියෝග කිරීමට සිසුන් සූදානම් කරයි. එහිදී පාසල ද්විතීයික සමාජානුයෝජන කාරකයක් ලෙස ද කටයුතු කරයි. විවිධ පසුබිම්වල සිසුන් දිනපතා අන්තර්ක්‍රියා කරන අද්විතීය පරිසරයක් පාසල තුළ පවතියි.

අභියෝග එසේ වුවද බහු සංස්කෘතික සමාජයක් තුළ ජීවත් වීමේදී වර්ණය, ජාතිකත්වය, ආගම හෝ මිනිසුන් වෙන් කරන වෙනත් නිර්ණායක නොසලකා සමාජයේ සියලුම පුද්ගලයන්ට සමාන අවස්ථා සහතික කරන සමාජ ඒකාබද්ධතාව ඇති කිරීමෙහිලා අධ්‍යාපනයේ තීරණාත්මක කාර්යභාරය හා වැදගත්කම අවතක්සේරු කළ නොහැකිය. එමෙන්ම අනාගතය භාර ගැනීමේ අරමුණින් සිය ඉගෙනුම් අත්දැකීම් ලබන සිසුවාට රටක ආර්ථික සංවර්ධනය පහසුවෙන්ම මල්ඵල ගැන්වීම සඳහා අත්‍යවශ්‍ය වන අන්තර් පුද්ගල සහයෝගිතාව සංවර්ධනය කිරීමේ දී සමාජ ඒකාබද්ධතාව ප්‍රතිමානයක් ලෙස කටයුතු කරන බව නොරහසකි.

**සී. එන්. ජයතිලක, කල්පනී ගුණරත්න, සුවිනි ප්‍රනාන්දු, වාසනා කරුණාරත්න, එන්. අබේගුණසේකර**

## හික්කඩුව වෙළෙඳ පොළ ගොඩනැඟිල්ල අබලන්

දකුණු පළාත් ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් හික්කඩුව නගරයේ ඉදිකරන ලද දෙමහල් පොදු වෙළෙඳපොළ ගොඩනැඟිල්ලේ ඉහළ මාලයේ වහල දිරාපත්ව, සෙවිලි තහඩු සුළඟට ගසාගෙන ගොස් ඇත. කඩ කාමරවල දොර ජනේල කිසිවක් නැත.

සුනාමි ආධාර යටතේ ලැබුණු රුපියල් කෝටි තිස්තුනක මුදලක් වැයකොට එදා එම ගොඩනැඟිල්ල සදා නිම කර ඇත. අද එය කිසිඳු ප්‍රයෝජනයකට නොගෙන අතහැර දමා තිබේ. හික්කඩුව නගර සභාව කිහිප වතාවක්ම ටෙන්ඩර් කැඳවූ නමුත් කඩ කාමර ඉහළ මාලයේ ලබා ගැනීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවූ බව නිලධාරීහු අප සමඟ පැවසූහ.

කඩ කාමරවල ප්‍රධාන දොරටුව පටු වීමත් දොරටුව ගාලු පාරට පිටුපා ඉදිකිරීම කඩකාමර බදු මුදල ඉතා අධික වීම මෙයට හේතුවී ඇති බව වෙළෙඳ ප්‍රජාව සඳහන් කරති. විනාශවන රජයේ දේපළ රැකගැනුමට වගකිවයුතු බලධාරී මහතුන්ගේ අවධානය මේ දෙස යොමු වෙනු ඇතැයි අපි විශ්වාස කරමු.

**අනුර ද සිල්වා**
**මාතර**